Department of Education,Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය - ආර්ථික විද්‍යාව

සතිය - 19

ශ්‍රේණිය - 13

සකස් කළේ-රත්නපුර කලාප අධ්‍යාපන කාර්යාලය

නිපුණතාව 09 - විදේශ වෙළෙඳාමේ න්‍යායාත්මක පදනම විග්‍රහ කරමින් විදේශ වෙළෙඳාම ශ්‍රී ලංකා ආර්ථිකය කෙරෙහි ඇති කරන බලපෑම ගවේෂණය කරයි.

නිපුණතා මට්ටම 9.4 - ගෝලීයකරණය,කලාපීයකරණය හා ද්වි පාර්ශ්වීය වෙළෙඳ ගිවිසුම් විමසයි.

ලෝක වෙළෙඳ සංවිධානයේ ප්‍රධාන අරමුණු

1.බහු පාර්ශ්වීය වෙළෙඳාම ප්‍රවර්ධනය කිරීම.
2.වෙළෙඳාම ක්‍රමවත්ව පවත්වා ගෙන යාම.
3.වෙළෙඳ බාධක අවම කිරීම සහ වෙළෙඳ නීති සංශෝධනය කිරීම මගින් ජාත්‍යන්තර වෙළෙඳ ක්‍රමය තුළ ප්‍රධාන ප්‍රතිසංස්කරණයන් ඇති කිරීම.

- ආර්ථික ගෝලීයකරණය යනු ලෝකයේ රටවල් වෙළෙඳ,ප්‍රාග්ධන,මූල්‍ය,තාක්ෂණ,ප්‍රතිපත්ති යනාදී විවිධ ප්‍රවාහයන් ඔස්සේ එකිනෙකට ඒකාබද්ධ වීමේ ක්‍රියාවලියයි.

1.ලෝකවෙළෙඳ සංවිධානයේ ප්‍රධාන කාර්යයන් 6 මොනවාද?

2.ගෝලීයකරණයට පක්ෂව කරුණු 5ක් ඉදිරිපත් කරන්න.

3.ගෝලීයකරණයට විපක්ෂව කරුණු 5ක් ඉදිරිපත් කරන්න.

4.ආර්ථික ඒකාබද්ධවීම් යනු කුමක්ද?එහි විවිධ ස්වරූප දක්වන්න.

5.විදේශ වෙළෙඳ ගිවිසුම්වල ඇති වැදගත්කම පහදන්න.